# ඇබෑර්තු

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

### මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP) - අදියර II

### (ව්‍යාපෘති කාලය - 2026 - 2031)

### කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP) සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) **චක්‍රලේඛ අංක 01/2019** සහ රජයේ බඳවා ගැනීම් පටිපාටින්ට අනුව පහත තනතුරු සඳහා "කොන්ත්‍රාත් පදනම" මත ව්‍යාපෘති කළමණාකරණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම පිණිස අදාළ සුදුසුකම් ඇති කැපවීම සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවා **2026.01.21** දින දිනමිණ පුවත්පතෙහි පලකරන ලද දැන්වීම මෙයින් සංශෝධනය කරනු ලැබේ.

උක්ත කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛය වෙනුවට 2026.02.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි අංක 01/2026 නව චක්‍රලේඛය නිකුත් කර තිබේ. ඒ අනුව, අදාළ තනතුරු සඳහා වන විස්තර, වැටුප් හා අවශ්‍ය සුදුසුකම් එම චක්‍රලේඛය පරිදි විය යුතු වේ. ඒ පිළිබඳව www.irrigationmin.gov.lk සහ www.treasury.gov.lk වෙබ් අඩවි වෙත පිවිසීමෙන් අදාළ තොරතුරු පරිශීලනය කළ හැකිය. එබැවින්, 01/2019 කළමණාකරණ සේවා චක්‍රලේඛයට අදාළව දැනට අප වෙත ලැබී ඇති අයදුම්පත් අතරින් බඳවාගැනීම් සිදු කරනුයේ අංක **01/2026** චක්‍රලේඛයේ දැක්වෙන සුදුසුකම් අනුව බව සඳහන් කරමි. මෙම බඳවාගැනීම් වලට අදාළව පළමුව අප විසින් **2026.01.21** දින දිනමිණ පුවත්පතේ පල කරන ලද දැන්වීමට අනුව දැනටමත් ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් **2026.02.02** දිනැති **01/2026** චක්‍රලේඛය පරිදි අවශ්‍ය අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් තම පෙර ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කිරීමට නොහැකි වූයේනම්, **01/2026** චක්‍රලේඛයට අනුව තම සුදුසුකම් සඳහන් කොට නැවත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා අයදුම් කිරීමට **2026.02.16** දින දක්වා කාලය දීර්ඝ කරනු ලැබේ.

තවද, මෙම අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ උපරිම වයස් සීමාව වයස **අවු: 64** ලෙස සංශෝධනය කරමි.

මේ පිළිබඳව ඉහත දැක්වෙන විස්තර හැර අනෙකුත් සියලු දැන්වීම් විස්තර **2026.01.21** දිනැති දිනමිණ පුවත්පතෙහි ඇති දැන්වීම පරිදි වන බව කරුණාවෙන් සලකන්න.

### ඇබෑර්තු විස්තරය

| අංකය | විස්තරය/ රැකියා ස්ථානය | වැටුප් තලය | තනතුරු ගණන |
|---|---|---|---|
| 01 | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය - කොළඹ | Category A සිට F දක්වා සහ සහය කාර්ය මණ්ඩලය | 71 |
| 02 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - මඩාටුගම | | 37 |
| 03 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - මොරගහකන්ද | | 38 |

**ලේකම්,**
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය,**
**10 වන මහල, ශ්‍රී ලංකා මහවැලි අධිකාරි ගොඩනැගිල්ල,**
**අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10.**